3534

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2013 අගෝස්තු
கல்விப் பொதுத் தராதரப் பத்திர(உயர் தர)ப் பரீட்சை, 2013 ஓகஸ்ற்
General Certificate of Education (Adv. Level) Examination, August 2013

නව නිර්දේශය
புதிய பாடத்திட்டம்
New Syllabus

ඉතිහාසය II (I කොටස)
வரலாறு II (பகுதி I)
History II (Part I)

25-B S II

පැය තුනයි
மூன்று மணித்தியாலம்
Three hours

යුරෝපා ඉතිහාසය - ඈත අතීතයේ සිට ක්‍රි.ව. 1989 දක්වා

විභාග අංකය: ..................................

**උපදෙස්:**

- මෙම කොටසේ ප්‍රශ්න **40** ක් ඇත. **සියලු ම** ප්‍රශ්නවලට **මෙම ප්‍රශ්න පත්‍රයේ ම** පිළිතුරු සපයන්න.
- එක් එක් ප්‍රශ්නයට ප්‍රතිචාර **පහ** බැගින් දී ඇති නමුදු නිවැරදි පිළිතුර වන්නේ **එකක්** පමණි. එම නිවැරදි පිළිතුර තෝරා දී ඇති **උපදෙස් පරිදි ලකුණු කරන්න.**
- **මෙම කොටසට ලකුණු 40 ක් දෙනු ලැබේ.**
- කොටස් දෙකට ම මුළු කාලය පැය තුනකි. පිළිතුරු ලියා අවසන් වූ පසු, **I** කොටස **II** කොටසේ පිළිතුරු පත් සමඟ **අමුණා භාර දෙන්න.**

## I කොටස

- අංක **1** සිට **10** තෙක් එක් එක් ප්‍රශ්නය සඳහා නම් **පහ** බැගින් දී ඇත. ඒවා අතුරෙන් **එකක්** පමණක් කවර හෝ හේතුවක් නිසා අනෙක් නම් සමඟ **නො ගැළපේ.** එම **නො ගැළපෙන** නම කුමක්දැයි හඳුනාගෙන එහි **අංකය වරහන තුළ ලියන්න.**

1. (1) බොස්පරස් (2) පිරනීස් (3) ඇල්ප්ස් (4) ඇපිනයින් (5) කොකේසස් (.........)

2. (1) ඇතන්ස් (2) ස්පාටා (3) තීබ්ස් (4) කොරින්ත් (5) ක්‍රීමියා (.........)

3. (1) ඇලෙක්සැන්ඩර් (2) ඔගස්ටස් (3) ඩයක්ලීෂියන් (4) කොන්ස්ටන්ටයින් (5) තියඩෝසියස් (.........)

4. (1) ඇන්ගල්වරු (2) සැක්සන්වරු (3) පැට්‍රිෂියන්වරු (4) ෆ්‍රැන්ක්වරු (5) හන්වරු (.........)

5. (1) නිකලස් කොපර්නිකස් (2) විලියම් ෂේක්ස්පියර් (3) ගැලිලියෝ ගැලිලි (4) ජොහැන්නස් කෙප්ලර් (5) අයිසැක් නිව්ටන් (.........)

6. (1) පාර්ලිමේන්තුව (2) කෝටීස් (3) එස්ටේට්ස් ජෙනරාල් (4) ස්ටාර් චේම්බර් (5) ඩූමා (.........)

7. (1) ලෆායට් (2) කැලෝන් (3) අබේ සියෙස් (4) මිරාබෝ (5) මැරට් (.........)

8. (1) ඇල්ජීරියාව (2) මොරොක්කෝව (3) ලිබියාව (4) ජැමෙයිකාව (5) කොංගෝව (.........)

9. (1) ඩැග් හැමර්ෂල් (2) ඌ තාන් (3) විලී බ්‍රාන්ට් (4) කුර්ට් වෝල්ඩ්හයිම් (5) කොෆි අනන් (.........)

10. (1) කෲෂෙෆ් (2) බ්‍රෙෂ්නෙෆ් (3) අන්ද්‍රොපොෆ් (4) ගොර්බචොෆ් (5) සොල්ෂෙනිට්සින් (.........)

[ දෙවෙනි පිටුව බලන්න.

- අංක **11** සිට **15** තෙක් ප්‍රශ්නවල **පද යුගල පහ** බැගින් දී ඇත. ඒවා අතුරෙන් එක යුගලයක පද එකිනෙකට **නො ගැළපේ. එම නො ගැළපෙන** යුගලය කුමක්ද'යි හඳුනාගෙන ඊට අදාළ **අංකය,** ඉදිරියේ ඇති **වරහන තුළ ලියන්න.**

**11.**
(1) හෝමර් - වීරකාව්‍ය
(2) සොක්‍රටීස් - ජීවවිද්‍යාව
(3) ඇරිස්ටෝටල් - තර්කශාස්ත්‍රය
(4) පයිතගරස් - ගණිතය
(5) හිපොක්‍රටීස් - වෛද්‍යවිද්‍යාව (.........)

**12.**
(1) ඉලියඩ් - ඔඩිසි
(2) හෙරඩෝටස් - තුසිඩිඩීස්
(3) රොමියුලස් - රීමස්
(4) ලිවි - ටැසිටස්
(5) රෝමවරු - මිලේච්ඡයෝ (.........)

**13.**
(1) ප්‍රොටගරස් - 'සියලුදේ මනින මිම්ම මිනිසා ය'
(2) ප්ලේටෝ - 'දර්ශනිකයෝ රජවරු විය යුතු ය'
(3) ඇරිස්ටෝටල් - 'මිනිසා දේශපාලන සත්ත්වයෙකි.'
(4) හොබ්ස් - 'කුමාරයා, නරියා සහ සිංහයා අනුකරණය කළ යුතු ය.'
(5) රූසෝ - 'මිනිසා නිදහස්ව උපත ලබයි; එහෙත් ඔහු හැමතැන ම යදමින් බැඳ දමා ඇත.' (.........)

**14.**
(1) යෝර්ක් - වෙනීසිය
(2) ස්ෆෝර්සා - මිලාන්
(3) මෙඩිචි - ෆ්ලොරන්ස්
(4) එස්තේ - ෆෙරාරා
(5) ගොන්සාගා - මැන්ටුවා (.........)

**15.**
(1) පෘතුගීසි - ගෝව
(2) ස්පාඤ්ඤය - මැනිලා
(3) ලන්දේසි - බතාවියාව
(4) ඉංග්‍රීසි - කල්කටාව
(5) ප්‍රංශ - මකාඕ (.........)

- අංක **16** සිට **25** තෙක් එක් එක් ප්‍රශ්නයෙහි නාම / ප්‍රකාශන / දින වකවානු සමූහයක් X සහ Y තීරුවල දී ඇත. Y තීරුවේ දී ඇති නාම / ප්‍රකාශන / දින වකවානු X තීරුවේ දී ඇති ඒවා සමඟ කිසියම් ආකාරයකට ගැළපේ. එහෙත් ඒවා දක්වා ඇත්තේ ගැළපෙන අනුපිළිවෙළට නො වේ. Y තීරුව, X තීරුව සමඟ ගැළපෙන අනුපිළිවෙළට සකස් කළ විට පහත දී ඇති සංයෝග **පහෙන්** එකක් නිවැරදි ය. නිවැරදි සංයෝගයට අයත් **අංකය** තෝරා **වරහන තුළ ලියන්න.**

**16.**

| | X | | Y |
|---|---|---|---|
| (i) | සියුස් | A | ප්‍රේමයට අධිපති දෙවඟන |
| (ii) | ඇතීනා | B | වයින් පානයට [සුරාවට] අධිපති දෙවියා |
| (iii) | ඇෆ්‍රොඩයිටී | C | මුහුදට අධිපති දෙවියා |
| (iv) | පොසීඩන් | D | අහසට අධිපති දෙවියා |
| (v) | ඩයනීසස් | E | ප්‍රඥාවට හා යුද්ධයට අධිපති දෙවඟන |

(1) DCEAB (2) CEABD (3) DEACB (4) BEACD (5) EDACB (.........)

**17.**

| | X | | Y |
|---|---|---|---|
| (i) | ටයිබර් ගඟ | A | ඉංග්‍රීසි ඕඩය |
| (ii) | ඩැනියුබ් ගඟ | B | උතුරු මුහුද |
| (iii) | සේන් ගඟ | C | මධ්‍යධරණී මුහුද |
| (iv) | එල්බ් ගඟ | D | බෝල්ටික් මුහුද |
| (v) | විස්ටියුලා ගඟ | E | කළු මුහුද |

(1) DCEAB (2) CEABD (3) DEACB (4) BEACD (5) EDACB (.........)

**18.**

| | X | | Y |
|---|---|---|---|
| (i) | ඇරිස්ටෝටල් | A | ඉතාලියේ ඉතිහාසය (*History of Italy*) |
| (ii) | මකියාවෙලි | B | දේශපාලනය (*Politics*) |
| (iii) | ගුයිසියාඩිනි | C | නීතියේ සාරය (*The Spirit of the Laws*) |
| (iv) | මොන්ටෙස්ක්‍යු | D | ජාතීන්ගේ ධනය (*Wealth of Nations*) |
| (v) | ඇඩම් ස්මිත් | E | කුමාරයා (*The Prince*) |

(1) DCEAB (2) CEABD (3) DEACB (4) BEACD (5) EDACB (.........)

[ තුන්වෙනි පිටුව බලන්න.

**19.**

| | X | | Y |
|---|---|---|---|
| (i) | බොටිචෙලි | A | අවසාන විනිශ්චය |
| (ii) | ලෙනාඩෝ ඩා වින්චි | B | පස්වන චාල්ස් අධිරාජයා |
| (iii) | මයිකලාංජලෝ | C | ඇතන්ස්හි පාසල |
| (iv) | රෆායල් | D | වීනස්ගේ උපත |
| (v) | ටිටියන් | E | මොනා ලිසා |

(1) DCEAB (2) CEABD (3) DEACB (4) BEACD (5) EDACB (.........)

**20.**

| | X | | Y |
|---|---|---|---|
| (i) | හැප්ස්බර්ග් | A | ප්‍රශියාව |
| (ii) | ටියුඩර් | B | නෙදර්ලන්තය |
| (iii) | බූර්බන් | C | එංගලන්තය |
| (iv) | හොහෙන්සොලර්න් | D | ඔස්ට්‍රියාව |
| (v) | ඔරෙන්ජ් | E | ප්‍රංශය |

(1) DCEAB (2) CEABD (3) DEACB (4) BEACD (5) EDACB (.........)

**21.**

| | X | | Y |
|---|---|---|---|
| (i) | තිස් අවුරුදු යුද්ධය | A | පැරිස් ගිවිසුම |
| (ii) | නැපෝලියානු යුද්ධ | B | වර්සායි ගිවිසුම |
| (iii) | ක්‍රිමියන් යුද්ධය | C | පෝට්ස්මත් ගිවිසුම |
| (iv) | රුසියානු-ජපන් යුද්ධය | D | වෙස්ට්ෆේලියා ගිවිසුම |
| (v) | පළමුවන ලෝක යුද්ධය | E | වියානා සම්මේලනය |

(1) DCEAB (2) CEABD (3) DEACB (4) BEACD (5) EDACB (.........)

**22.**

| | X | | Y |
|---|---|---|---|
| (i) | ඔස්ට්‍රියාව | A | හොල්ස්ටයින් |
| (ii) | පීඩ්මොන්ට් | B | ලොරේන් |
| (iii) | සැවෝයි | C | සාර්ඩිනියා |
| (iv) | ෂ්ලෙස්විග් | D | හංගේරියාව |
| (v) | ඇල්සාස් | E | නීස් |

(1) DCEAB (2) CEABD (3) DEACB (4) BEACD (5) EDACB (.........)

The National e-learning Portal for The General Education

**23.**

| | X | | Y |
|---|---|---|---|
| (i) | නැපෝලියන් බොනපාට් | A | නව ආර්ථික ප්‍රතිපත්තිය |
| (ii) | ඔටෝ ෆොන් බිස්මාර්ක් | B | පෙරෙස්ත්‍රොයිකා ප්‍රතිපත්තිය හෙවත් ආර්ථික ප්‍රතිව්‍යුහකරණය |
| (iii) | වී.අයි. ලෙනින් | C | මාර්ෂල් සැලැස්ම |
| (iv) | ජෝර්ජ් මාර්ෂල් | D | ලේ සහ යකඩ ප්‍රතිපත්තිය |
| (v) | මිහායල් ගොර්බචොෆ් | E | මහද්වීපික ක්‍රමය |

(1) DCEAB (2) CEABD (3) DEACB (4) BEACD (5) EDACB (.........)

**24.**

| | X | | Y |
|---|---|---|---|
| (i) | තරුණ ඉතාලිය | A | ට්‍රොට්ස්කි |
| (ii) | රතු කමිස හමුදාව | B | මැසිනි |
| (iii) | රතු හමුදාව | C | මුසෝලිනී |
| (iv) | කළු කමිස හමුදාව | D | හිට්ලර් |
| (v) | දුඹුරු කමිස හමුදාව | E | ගැරිබෝල්ඩි |

(1) DCEAB (2) CEABD (3) DEACB (4) BEACD (5) EDACB (.........)

**25.**

| | X | | Y |
|---|---|---|---|
| (i) | ජාත්‍යන්තර කම්කරු සංවිධානය (ILO) | A | නිව්යෝර්ක් |
| (ii) | ජාත්‍යන්තර අධිකරණය (ICJ) | B | පැරිස් |
| (iii) | එක්සත් ජාතීන්ගේ ළමා අරමුදල (UNICEF) | C | ජිනීවා |
| (iv) | එක්සත් ජාතීන්ගේ අධ්‍යාපන, විද්‍යාත්මක සහ සංස්කෘතික සංවිධානය (UNESCO) | D | රෝමය |
| (v) | ලෝක ආහාර වැඩසටහන (WFP) | E | හේග් |

(1) DCEAB (2) CEABD (3) DEACB (4) BEACD (5) EDACB (.........)

3534

● අංක **26** සිට **30** තෙක් එක් එක් ප්‍රශ්නයට දක්වා ඇති **(A)**, **(B)**, **(C)** සහ **(D)** යන ප්‍රතිචාර හතර අතුරෙන් **එකක් හෝ කිහිපයක් හෝ නිවැරදි ය.** නිවැරදි ප්‍රතිචාරය හෝ ප්‍රතිචාර හෝ තෝරා,

(A) සහ (B) පමණක් නිවැරදි නම් ........................................ 1 ද,
(B) සහ (C) පමණක් නිවැරදි නම් ........................................ 2 ද,
(C) සහ (D) පමණක් නිවැරදි නම් ........................................ 3 ද,
(A) සහ (C) පමණක් නිවැරදි නම් ........................................ 4 ද,
ප්‍රතිචාර **එකක්** හෝ **දෙකකට** වැඩි සංඛ්‍යාවක් හෝ නිවැරදි නම් .......... **5 ද, වරහන තුළ ලියන්න.**

| **උපදෙස් සම්පිණ්ඩනය** | | | | |
|---|---|---|---|---|
| 1 | 2 | 3 | 4 | 5 |
| (A) සහ (B) පමණක් නිවැරදි ය. | (B) සහ (C) පමණක් නිවැරදි ය. | (C) සහ (D) පමණක් නිවැරදි ය. | (A) සහ (C) පමණක් නිවැරදි ය. | ප්‍රතිචාර **එකක්** හෝ **දෙකකට** වැඩි සංඛ්‍යාවක් නිවැරදි ය. |

**26. පහත දැක්වෙන්නන් අතුරෙන් ග්‍රීක නාට්‍ය රචකයෝ කවරහු ද?**
(A) ඊස්කිලස් (*Aeschylus*)
(B) පින්ඩාර්
(C) සොෆොක්ලීස්
(D) ඩිමොක්‍රිටස් (.........)

**27. පහත සඳහන් විශ්වවිද්‍යාල අතුරෙන් මධ්‍යතන යුරෝපයේ ආදිතම විශ්වවිද්‍යාල කවරේ ද?**
(A) ඔස්ලෝ විශ්වවිද්‍යාලය
(B) ලිවර්පූල් විශ්වවිද්‍යාලය
(C) බොලොඤ්ඤ විශ්වවිද්‍යාලය
(D) පැරිස් විශ්වවිද්‍යාලය (.........)

**28. පහත සඳහන් කරුණු අතුරෙන් වැඩවසම්ක්‍රමයේ ලක්ෂණ කවරේ ද?**
(A) ශක්තිමත් මධ්‍යම ආණ්ඩුව
(B) රදළ ප්‍රභු පන්තිය
(C) ප්‍රවේණිදාස පන්තිය
(D) ශක්තිමත් ස්ථාවර යුද්ධ හමුදාව (.........)

**29. පෘතුගීසීන් නිරත වූ දේශ ගවේෂණ සම්බන්ධයෙන් පහත සඳහන් කවර ප්‍රකාශය/ ප්‍රකාශ නිවැරදි වේ ද?**
(A) ආසියාවට නව මාර්ගයක් සොයා ගැනීම ප්‍රධාන අරමුණ විය.
(B) මුල් ගවේෂණ නාවික හෙන්රිගේ අනුග්‍රහය යටතේ සිදු කරන ලදී.
(C) පෘතුගීසීහු ප්‍රෙස්ටර් ජෝන් සමග සම්බන්ධතා ඇතිකර ගැනීමට සමත් වූහ.
(D) 1478 දී වස්කෝ ද ගාමා ගෝවට පැමිණියේ ය. (.........)

**30. පහත දැක්වෙන්නන් අතුරෙන් බ්‍රිතාන්‍යයේ අගමැතිවරු කවරහු ද?**
(A) කාසල්රී
(B) කැනිං
(C) ඩිස්රායලි
(D) ග්ලැඩ්ස්ටන් (.........)

● අංක **31** සිට **35** තෙක් සෑම ප්‍රශ්නයකට ම එක් මාතෘකාවක් යටතේ කරුණු **පහ** බැගින් සපයා ඇත. එම කරුණු අතුරෙන් **එකක්** අදාළ මාතෘකාවට **නො ගැළපේ**. එම **නො ගැළපෙන** කරුණ තෝරා එහි **අංකය** ඉදිරියේ වරහන තුළ ලියන්න.

**31. තිස් අවුරුදු යුද්ධය**
(1) තිස් අවුරුදු යුද්ධය 1618 දී ජර්මනිය කේන්ද්‍ර කරගෙන ආරම්භ විය.
(2) එය කතෝලිකයන් හා ප්‍රොතෙස්තන්තවාදීන් අතර ඇති විය.
(3) මෙම යුද්ධයේ දී ප්‍රංශය කතෝලිකයන්ට ආධාර දුන්නේ ය.
(4) ප්‍රොතෙස්තන්තවාදීන් ජයග්‍රහණය කරමින් යුද්ධය අවසන් විය.
(5) තිස් අවුරුදු යුද්ධය යුරෝපයේ ආගමික යුද්ධවල අවසානය සලකුණු කළේ ය. (.........)

**32. කාර්මික විප්ලවය**
(1) ග්‍රාමීය කෘෂිකාර්මික ආර්ථිකයක සිට යන්ත්‍රෝපකරණ භාවිතයෙන් නිෂ්පාදන කටයුතු කරන නාගරික ආර්ථිකයකට පරිවර්තනය වීම "කාර්මික විප්ලවය" යන්නෙන් අදහස් කෙරේ.
(2) කාර්මික විප්ලවය එංගලන්තයේ ආරම්භ විය.
(3) අනතුරුව එය යුරෝපයේ අන් රටවල ද ව්‍යාප්ත විය.
(4) කාර්මික විප්ලවයෙන් ප්‍රතිලාභ ලැබූ පළමු යුරෝපීය රට පෘතුගාලයයි.
(5) කාර්මික විප්ලවය එළදායිතාව වර්ධනය කළේ ය. (.........)

[ පස්වෙනි පිටුව බලන්න.

**33. ප්‍රංශ විප්ලවය**

(1) 'ටෙනිස් පිටියේ දිවුරුම' ප්‍රංශ විප්ලවයේ ආරම්භය සලකුණු කළේ ය.
(2) 1789 ජූලි 14 ද බැස්ටීලය බිඳ හෙළනු ලැබී ය
(3) දහත්වන ලුවී ව්‍යවස්ථානුකූල රජකෙනෙකු ලෙස ඔටුනු පළඳවනු ලැබී ය.
(4) මිනිස් අයිතිවාසිකම් ප්‍රකාශය ජාතික සභාව විසින් නිකුත් කරන ලදී
(5) විප්ලවයෙන් වඩාත් ම ප්‍රතිලාභ ලැබුවෝ මධ්‍යම පන්තිකයෝ ය. (.........)

**34. ජර්මනිය එක්සත් කිරීම**

(1) සොල්වරීනය ප්‍රශියානු නායකත්වය යටතේ පිහිටවනු ලැබීම
(2) බිස්මාර්ක් 1862 දී ප්‍රශියාවේ චාන්සලර් ධූරයට පත්වීම
(3) සත් සති යුද්ධයෙන් ඔස්ට්‍රියාව පරාජයට පත් කොට,1866 දී ප්‍රශියානු පාලනය යටතේ උතුරු ජර්මන් සංයුක්ත රාජ්‍යය පිහිටවනු ලැබීම
(4) ප්‍රංශ-ප්‍රශියානු යුද්ධයෙන් ජර්මනිය එක්සත් කිරීම සම්පූර්ණ වීම
(5) 1871 දී වික්ටර් එමැනුවෙල් රජු ජර්මන් අධිරාජයා බවට පත් වීම (.........)

**35. ඉතාලියේ ෆැසිස්ට්වාදය**

(1) වයිමාර් සමූහාණ්ඩුවේ දුර්වලතා ඉතාලියේ ෆැසිස්ට්වාදය නැගී ඒමට මග පෑදී ය.
(2) බෙනිටෝ මුසෝලිනී ඉතාලියේ ෆැසිස්ට්වාදයේ නායකයා විය.
(3) 1922 දී ඔහු ඉතාලියේ බලය අත් කර ගත්තේ ය.
(4) ඔහු රෝමානු කතෝලික පල්ලිය සමඟ එකඟතාවක් ඇතිකර ගත්තේ ය.
(5) ෆැසිස්ට් ඉතාලිය 1935 දී ඉතියෝපියාව ආක්‍රමණය කළේ ය. (.........)

- අංක **36** සිට **40** තෙක් ප්‍රශ්නවලට අදාළ ව ප්‍රකාශ දෙක බැගින් දී ඇත. එක් එක් ප්‍රශ්නය සම්බන්ධයෙන් දී ඇති ප්‍රකාශ යුගලයට හොඳින් ම ගැළපෙනුයේ පහත වගුවෙහි දක්වෙන **1, 2, 3, 4** සහ **5** යන කවර ප්‍රකාශ යුගලයද'යි තෝරා ඊට අදාළ **අංකය වරහන තුළ ලියන්න.**

| | පළමුවැනි ප්‍රකාශය | දෙවැනි ප්‍රකාශය |
|---|---|---|
| 1. | නිවැරදි ය. | වැරදි ය. |
| 2. | නිවැරදි ය. | නිවැරදි ය. |
| 3. | වැරදි ය. | වැරදි ය. |
| 4. | වැරදි ය. | නිවැරදි ය. |
| 5. | නිවැරදි ය. | නිවැරදි වන අතර **පළමුවැන්න** මැනවින් පහදා දෙයි. |

| | පළමුවැනි ප්‍රකාශය | දෙවැනි ප්‍රකාශය | |
|---|---|---|---|
| **36.** | පොදු භාෂාවක් ව්‍යවහාර කරමින් පොදු සංස්කෘතියකට හිමිකම් පෑ නමුත් ග්‍රීකයෝ දේශපාලන වශයෙන් බෙදී සිටිය හ. | සෑම පෞර රාජ්‍යයක ම ස්වාධීනත්වය ආරක්ෂා කර ගැනීමට ග්‍රීකයන් තුළ පැවැති අධිෂ්ඨානය ඔවුන් අතර පුළුල් දේශපාලන ඒකීයත්වයක් ඇති වීම වළකාලී ය. | (.........) |
| **37.** | විනෝදය සඳහා වූ ස්ථානයක් වශයෙන් මහා ඇලෙක්සැන්ඩර් රෝමයේ කොලෝසියම ගොඩ නැගී ය. | අතිශය වැදගත් රෝම උරුමයන් අතුරෙන් එකක් නම් ඔවුන්ගේ නීති ක්‍රමයයි. | (.........) |
| **38.** | පැරසෙල්සස් රුධිර සංසරණය සොයා ගත්තේ ය. | උත්කෘෂ්ට විප්ලව සමයේ දී එංගලන්ත පාලක පළමුවන චාල්ස් රජතුමා හිස ගසා මරණයට පත් කරනු ලැබී ය. | (.........) |
| **39.** | සෑම කුමාරයකුට ම සිය රාජ්‍යයේ ආගම ලෙස ලූතර්වාදය හෝ කතෝලික ආගම හෝ තෝරා ගැනීමේ අයිතිය ඔග්ස්බර්ග් සාම ගිවිසුමෙන් පිළිගනු ලැබී ය. | ඔග්ස්බර්ග් සාම ගිවිසුම කතෝලික සභාව ප්‍රතිසංස්කරණය කිරීම සඳහා ට්‍රෙන්ට් සම්මේලනය කැඳවීමට ද මග පෑදී ය. | (.........) |
| **40.** | 1949 දී උතුරු අත්ලාන්තික් ගිවිසුම් සංවිධානය (NATO) පිහිටුවනු ලැබී ය. | බර්ලින් තාප්පය කඩා බිඳ හෙළීමෙන් පසු නැගෙනහිර හා බටහිර ජර්මනිය යළි එක්සත් කරන ලදී. | (.........) |

* *

COMPLETED BY.......... ON

3536



සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம் இலங்கைப் பரீட்சைத் திணைக்களம் இலங்கைப் பரீட்சைத் திணைக்களம் இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka Department of Examinations, Sri Lanka Department of Examinations, Sri Lanka Department

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2013 අගෝස්තු
கல்விப் பொதுத் தராதரப் பத்திர(உயர் தர)ப் பரீட்சை, 2013 ஓகஸ்ற்
General Certificate of Education (Adv. Level) Examination, August 2013

නව නිර්දේශය
புதிய பாடத்திட்டம்
New Syllabus

ඉතිහාසය II (II කොටස)
வரலாறு II (பகுதி II)
History II (Part II)

**25-B** **S** **II**

**යුරෝපා ඉතිහාසය - ඈත අතීතයේ සිට ක්‍රි.ව. 1989 දක්වා**

**උපදෙස්:**

✻ **පළමුවන** ප්‍රශ්නයටත් තවත් ප්‍රශ්න **තුනකටත්** පිළිතුරු සපයන්න.

(**පළමුවන** ප්‍රශ්නයට පිළිතුරු සැපයීම සඳහා **යුරෝපයේ දළ සිතියමක්** සපයා ඇත.)

## II කොටස

1. ඔබට සපයා ඇති සිතියමේ පහත සඳහන් **සියලු ම ස්ථාන ලකුණු කොට නම් කරන්න.** ඒවායින් කැමති **දෙකක්** පිළිබඳ ව කෙටි ඓතිහාසික සටහන් ලියන්න.

   (i) ඇතන්ස් (ii) මධ්‍යධරණී මුහුද
   (iii) සිසිලි (iv) ඩැනියුබ් ගඟ
   (v) ජිනෝවා (vi) පෘතුගාලය
   (vii) ලිවර්පූල් (viii) බර්ලින්

   *(නිවැරදි ව ලකුණු කිරීමට හා නම් කිරීමට ලකුණු 01 බැගිනි. කෙටි ඓතිහාසික සටහනකට ලකුණු 05 බැගිනි)*

2. (i) ග්‍රීක පෞර රාජ්‍යවල පැවැති ආණ්ඩුක්‍රම සැකෙවින් දක්වන්න. *(ලකුණු 07 යි)*

   (ii) රෝම ආණ්ඩුක්‍රම විකාශයේ ප්‍රධාන අවස්ථා ගෙන හැර දක්වන්න. *(ලකුණු 07 යි)*

3. (i) ඉතාලියේ පුනරුදය ආරම්භවීමට තුඩුදුන් සාධක පරීක්ෂා කරන්න. *(ලකුණු 06 යි)*

   (ii) පුනරුදයේ ප්‍රධාන කාර්යසිද්ධීන් සාකච්ඡා කරන්න. *(ලකුණු 08 යි)*

4. "ප්‍රොතෙස්තන්ත රෙපරමාදුව ආගමික විප්ලවයක් ලෙස හැඳින්වීම වඩාත් යෝග්‍ය වේ."

   (i) ප්‍රොතෙස්තන්ත රෙපරමාදුව ආරම්භ වූ රට නම් කරන්න. *(ලකුණු 01 යි)*

   (ii) ප්‍රොතෙස්තන්ත රෙපරමාදුවේ නායකයන් **දෙදෙනකු** නම් කරන්න. *(ලකුණු 02 යි)*

   (iii) ප්‍රොතෙස්තන්ත රෙපරමාදුව ඇතිවීමට තුඩු දුන් ආගමික, දේශපාලන හා ආර්ථික හේතු සැකෙවින් දක්වන්න. *(ලකුණු 04 යි)*

   (iv) ප්‍රොතෙස්තන්ත රෙපරමාදුවේ ප්‍රතිඵල ඇසුරෙන් ඉහත සඳහන් ප්‍රකාශය සාකච්ඡා කරන්න. *(ලකුණු 07 යි)*

5. "අමෙරිකානු නිදහස් සටන අමෙරිකාව සම්බන්ධයෙන් පමණක් නොව යුරෝපය සම්බන්ධයෙන් ද දැඩි බලපෑමක් ඇති කෙළේ ය."

   (i) අමෙරිකානු නිදහස් සටනේ නායකයා නම් කරන්න. *(ලකුණු 01 යි)*

   (ii) අමෙරිකානු නිදහස් සටනේ ප්‍රධාන සටන් පාඨය වූයේ කුමක් ද? *(ලකුණු 01 යි)*

   (iii) උතුරු අමෙරිකාවේ තිබූ ඉංග්‍රීසි ජනපද **හතරක්** නම් කරන්න. *(ලකුණු 02 යි)*

   (iv) අමෙරිකානු නිදහස් සටන ඇතිවීමට තුඩු දුන් ආර්ථික හා දේශපාලන සාධක සැකෙවින් දක්වන්න. *(ලකුණු 04 යි)*

   (v) අමෙරිකානු නිදහස් සටනේ ප්‍රතිඵල ඇසුරෙන් ඉහත සඳහන් ප්‍රකාශය පරීක්ෂා කරන්න. *(ලකුණු 06 යි)*

6. "නැපෝලියන් බොනපාට් ප්‍රංශ විප්ලවයේ අරමුණු හා පරමාර්ථ ඉදිරියට ගෙන ගියේ ය."

   (i) නැපෝලියන් බොනපාට් උපන් ස්ථානය කුමක් ද? *(ලකුණු 01 යි)*

   (ii) ඔහු සිය හමුදා අධ්‍යාපනය ලැබුවේ කොහේදී ද? *(ලකුණු 01 යි)*

   (iii) ප්‍රංශ අධිරාජයා බවට පත්වන තෙක් ඔහුගේ ප්‍රගමණය සැකෙවින් දක්වන්න. *(ලකුණු 04 යි)*

   (iv) නැපෝලියන් බොනපාට්ගේ දේශීය ප්‍රතිපත්ති ඇසුරෙන් ඉහත සඳහන් ප්‍රකාශය විවේචනාත්මක ව විමසන්න. *(ලකුණු 08 යි)*

[ හත්වෙනි පිටුව බලන්න.

**7.** ඉතාලි එක්සත්භාවය සාක්ෂාත් කර ගැනීමෙහි ලා මැසිනි, කැවූර් හා ගැරිබෝල්ඩි යන නායකයන්ගේ දයකත්වය අගයමින් ඉතාලි එක්සත් ව්‍යාපාරයේ ප්‍රධාන අවස්ථා ගෙන හැර දක්වන්න. *(ලකුණු 14 යි)*

**8.** පහත දක්වෙන මාතෘකා අතුරෙන් ඕනෑම **දෙකක** ඓතිහාසික වැදගත්කම පිළිබඳ ව කෙටි සටහන් ලියන්න.

(i) රෝම අධිරාජ්‍යය තුළ ක්‍රිස්තියානිය ව්‍යාප්තවීම

(ii) වැඩවසම්ක්‍රමය

(iii) වෙස්ට්පේලියා සාම ගිවිසුම

(iv) වියනා සම්මේලනය

(v) තුෂ්ණිං යුද්ධය (Cold War) *( එක්සටහනකට ලකුණු 07 බැගිනි)*

**9.** **එක්කෝ** (A) කොටසට **නැතහොත්** (B) කොටසට පමණක් පිළිතුරු සපයන්න.

**(A)** "ජාතීන්ගේ සංගමය ලොවට චිරස්ථායි සාමයක් ගෙන ඒමට අසමත් විය."

(i) ජාතීන්ගේ සංගමය පිහිටුවීම සඳහා විධිවිධාන සලසන ලද ගිවිසුම නම් කරන්න. *(ලකුණු 01 යි)*

(ii) ජාතීන්ගේ සංගමයේ මහ සභාවේ ස්ථිර සාමාජිකයන් **දෙදෙනකු** නම් කරන්න *(ලකුණු 02 යි)*

(iii) ජාතීන්ගේ සංගමයේ ප්‍රධාන අරමුණු කවරේ ද? *(ලකුණු 03 යි)*

(iv) ජාතීන්ගේ සංගමය දෙවන ලෝක යුද්ධය ඇතිවීම වැළැක්වීමට අසමත්වීම කෙරෙහි විශේෂ අවධානය යොමු කරමින් ඉහත සඳහන් ප්‍රකාශය සාකච්ඡා කරන්න. *(ලකුණු 08 යි)*

**නැතහොත්**

**(B)** දෙවන ලෝක යුද්ධයෙන් උද්ගත වූ ප්‍රතිඵල විවේචනාත්මක ව විමසන්න. *(ලකුණු 14 යි)*

* * *

The National e-learning Portal for The General Education

3536

AL/2013/25-B-E-II

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2013 අගෝස්තු
கல்விப் பொதுத் தராதரப் பத்திர(உயர் தர)ப் பரீட்சை, 2013 ஓகஸ்ற்
General Certificate of Education (Adv. Level) Examination, August 2013


නව නිර්දේශය
புதிய பாடத்திட்டம்
New Syllabus

ඉතිහාසය II
வரலாறு II
History II

25-B S

ප්‍රශ්න අංකය / வினா இல. / Question No. 01

විභාග අංකය / சுட்டெண் / Index No. ........................................




මෙතැනින් කපන්න.

WWW.PastPapers.WIKI
Past Papers Wiki - Download More Past Papers and Study Well!